ECHO OF HIS CALL

කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

1969 to 2029 — 60 — REACHING NATIONS — ECHO OF HIS CALL — SINCE 1969

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Hon. Editor-in-Chief: REV. DR. ANGELINE SELVAKUMARI HENRY

16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 NOVEMBER Issue No. 12



ශුද්ධවූ බයිබලය

(ගීතාවලිය 16:1-7)

1. දෙවියන්වහන්ස, මා ආරක්ෂාකළ මැනව. මක්නිසාද ඔබ සරණ කොටගනිමි.
2. ඔබ මාගේ ස්වාමීවහන්සේය, ඔබ හැර යහපතක් මට නැතැයි ස්වාමීන්ට කීමි.
3. පොළොවේ සිටින ශුද්ධවන්තයෝ වනාහී මාගේ මුළු ප්‍රීතිය උපදවන උත්තමයෝය.
4. ස්වාමීන් අත්හැර අන් දෙවිකෙනෙකු පිළිගන්නන්ගේ දුක් බෝවන්නේය. ඔවුන් ලෙයින් කරන පාන පූජා මම පූජා නොකරන්නෙමි, ඔවුන්ගේ නම් මාගේ කටින් නොකියන්නෙමි.
5. මාගේ උරුම කොටසක් කුසලාන්කොටසත් ස්වාමීන්වහන්සේය. ඔබ මාගේ කොටස රක්ෂාකරනසේක.
6. මට මායිම් වුණේ ප්‍රසන්න තැන්වලය. එසේය, මට ප්‍රියකරු උරුමයක් ඇත.
7. මට දැනමිහිකම් දුන්නාවූ ස්වාමීන්ට ස්තුති ප්‍රශංසාකරන්නෙමි. එසේය, රාත්‍රී භාගයේදී මාගේ සිතිවිලිවලින් මට ගුරුකම් ලැබේ.



ඔබට රක්ෂස්ථානයක් තිබේ! ආපසු නොහැරෙන්න!

YOU HAVE A REFUGE! DON'T LOOK BACK!

(සහෝදරී එන්ජලින්)



අපගේ ස්වාමී වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔබට කරුණාවක් සම්මදානයක් වේවා! අපගේ සතුරාගෙන් සහ අපගේ පාපයෙන් අප මුදවන ලිණිස කම් ඒවිතය දුන් කරමින් අපට නිදහස දුන්නා වූ උත්ථාන්සේ අපගේ රක්ෂස්ථානය හා බලකොටුවයි. එසේම විපත්තියේදී අපට හිමිවන්නාවූ දුකේදී ඉතා ලඟින් සිටින්නා වූ පදාකාලිකවූ හිමිවක්ත.

අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සතුරා සේවයේ යවුලට එකවී සිටින ඔබ සැම දෙනාටම අපගේ ස්තුතිය පුද්කරමි. සැම මසකම මෙම සතුරාව කුළින් ඔබ හා අපට එකවීමට ලැබීම ගැන අප ඔබට ඉතා ස්තුතිවන්ත වෙමු. මෙම සතුරාව ඔබට ආශීර්වාදයක් වී ඇත්නම් ඔබගේ සාක්ෂි, සිතුවිලි හා යෝජනා අපහා සමග බෙදාගන්න. ඒවා අපට ඉමහත් ධෛර්යයක් ඇති කරන්නේය.

ස්වාමීන්වහන්සේ අපගේ රක්ෂස්ථානයයි!

උත්ථාන්සේ කුළ අපව ආරක්ෂාවට, ශක්තිය හා බලාපොරොත්තුව තිබේ.

දෙවියන් වහන්සේගේ නාමයන්,

දේව වචනය කුළ දෙවියන් වහන්සේව හඳුන්වා දීමට විවිධ නාම යොදා තිබේ. එම සෑම නාමයකින්ම උත්ථාන්සේගේ චරිතය ස්වභාවය සහ උත්ථාන්සේගේ සෙනග සමඟ ඇති සම්බන්ධතාවය පිළිබඳව යමක් හෙළිදරව් කරයි. දෙවියන්වහන්සේ පිළිබඳව ඔහුගේ නිතට නඳින්ම කා වැදගත්ම කාරණය නම්; උත්ථාන්සේ අපගේ රක්ෂස්ථානයයි.

මේ සම්බන්ධව විවිධ භාෂාවන් වලින් කෙරුම් කර තිබෙන්නේ හෙබ්‍රෙව් භාෂාව මා හොඳහිමි. නමුත් ඉවිඩ බයිබලයෙහි රූපවරණය යන්තට තේරුම් "මරෙයිවිඩම්".

3 වෙනි පිටුවට ...

Echo of His Call

Christian YouTube Channel!

Every day 2 minutes message by

Pr. S. Sam Selva Raj!

in English, Hindi Language - 1.00 A.M.,

in Tamil & Telugu Language - 2.00 A.M.

and

Tamil & English Message & Prayer

Sunday 8.30 A.M. & 6.00 P.M.

Please Subscribe if you are blessed! Share with whom you love & care!!

ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

from your dearly beloved brother...





Founders

OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

"නුඹලාගේ ලැජ්ජාව වෙනුවට දෙගුණයක් ලබන්නහුය. නින්දාව වෙනුවට ඔවුහු තමන්ගේ කොටස ගැන ප්‍රීතිමත් වන්නාහ. එබැවින් ඔහු තමන්ගේ දේශයෙහි දෙපංගුවක් කුකුළු විදින්නාහ. සදාකාල ප්‍රීතිය ඔවුන්ට වන්නේය." (යෙසායා 61:7)

ප්‍රිය මිතුවරුනි,

අපගේ ස්වාමිවූ, ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සුභ පතමි! "කැළඹිමේ ප්‍රතිරාවය" සඟරාවේ මෙම කලාපය කියවීම ගැන අපි ඔබට ස්තුතිවන්ත වෙමු. දෙවියන් වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක!



මගේ ආදරණීය බිරිඳ වන ජෙසී වීනා සෑම් මහතිමය දීර්ඝ කාලීන හෘදයාබාධ නිසා පසු 2026 සැප්තැම්බර් මස 20වන දින රාත්‍රී 10.00 ට මිහිමයට ඇතුළු විය. අය පසුගිය වසර 3ක් තුරම මා සමඟ අපගේ ස්වාමීන් වහන්සේට විශ්වාසවන්තව සේවය කළාය. අය අපගේ තරුණ සාර්ථකව අවසන් කළාය. අප ඉතමිනිම් අයව නැවතත් අහසේ දී හමුවෙමු. මා සමඟ අපගේ අර්ථවත් ජීවිතය ගෙ අපගේ ඉවියන්වහන්සේට දැනෙකා කරමු. මගේ හදවතෙහි තිබෙන හැකිම දුකාශ කිරීමට මා තව වචන නොමැත.

මාගේ මිණිබිරිය වන සහෝදරී ඇන්ඩ්‍රියා ක්‍රිස්මස් හෙන්රි සහ දියණිය වන දේවගැති ඇන්ජලින් සෙල්වි කුමාරි හෙන්රි යන අය පාලක මණ්ඩලය විසින් "කැළඹිමේ ප්‍රතිරාවය" අනාගත සේවාවන් කරගෙන යාම සඳහා පත් කරනු ලැබේ. නිල වශයෙන් විධිමත් කටයුතු අවසන් වන තුරු මම ඔවුන්ට සහාය වෙමි.

ගරු ආචාර්ය එම්. මුත්තු, සභාපති, සහෝදර මෝසෙස් (මුනුබුරා) පාස්ටර් සෑම්, සහෝදරී ඇන්ඩ්‍රියා සහ දේවගැති ඇන්ජලින්



Rev. Dr. M. Muthu, Chairman, Bro. Moses (grandson), Pr. Sam, Sis. Andrea & Rev. Angeline



HON. EDITOR-IN-CHIEF
Rev. Dr. Angeline Selvakumari Henry, M.A., M.Sc., M.Ed.

CONTRIBUTING EDITOR
Sis. Andrea Christmas Henry

EX. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.

EX. ADMINISTRATOR
Sis. Jesy Veena Sam

GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.

ADMINISTRATION
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

EDITORIAL BOARD
Sis. Sajini Cherian
Rev. Dr. J. John Rajarathnam, B.E.S., B.D., M.Th.
Rev. Dr. K.R. Rajasekaran
Adv. N. Balaji, B.Com., M.L.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293
Cell : (+91) 98410 71852, 98412 71858

E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

YOUTUBE CHANNEL
Echo of His Call

සැප්තැම්බර් 26 වන දින, උදෑසන 9.30 සිට පස්වරු 2.30 දක්වා අපගේ ප්‍රධාන දේවස්ථානයේදී, "යේසුස් වහන්සේගේ පවුල - මිහිරි දිමනාවත්" **The Family of Jesus –**



A Sweet Get-Together යන තේමාව යටතේ ඉතා ආශීර්වාදාත්මක සේවාවක් පැවැත්වූ අතර, ඒ සඳහා කාන්තා පුරුෂ පාර්ශවයන් 100ත් පමණ සහභාගී වූහ. නෙහෙමියා බයිබල් විද්‍යාලයේ, විදුහල්පති දේවගැති ආචාර්ය ජේ. ජෝන් රාජරත්නම් මහතා මහඟි අදහසුගෙන් අලස කටයුතු තෑල්ල. සහභාගී වූ සියලු දෙනාටම නව ආශ්වාදයක් ලැබීම තුළින් මහත් ආශීර්වාදයක් හිමි විය.

තැවැමේ ප්‍රතිඵල දේව සේවය වෙනුවෙන් යාච්ඤා කරමින් සහ අප සමග එක්ව සිටීම පිළිබඳව අපි ඔබට කෘතඥතා දිනමි. තරුණතර දිනවලි අප වෙනුවෙන් යාච්ඤා කරන්න.

දෙවියන්වහන්සේ ඔබට ආශීර්වාද තරන සේක!

දෙවියන්වහන්සේ ඔබට බහුල ලෙස ආශීර්වාද කරයි!

In Christ Jesus, your servant, **Pr. S. Sam Selva Raj**

E.mail : sam@echoofhiscall.org

1 පිටුවෙන්....

''පුහුලිවම් සහ ඉඩෙයිකලම්'' යන වචන භාවිතා කරමින් ඉතා ඉලක්කාර ලෙස ප්‍රකාශ කර ඇත. එහිදී ශෝර්ලම් කර දෙන්නේ; සැතෙවන ස්ථානය, නවාතැන් ස්ථානය, ආරක්ෂිත ස්ථානය සහ ලුසව සම්පූර්ණයෙන්ම ආවරණය කරන ආරක්ෂිත ස්ථානයක් ලෙසවය.

අපගේ දෙවියන්වහන්සේ කොහරම් අලංකාරද?

අපගේ ජීවිතය වටා තිබෙන යෑම දෙයක්ම අස්ථිරව තිබෙන විට දෙවියන් වහන්සේ අපගේ රක්ෂස්ථානය වෙයි. දෙවියන්වහන්සේ අපගේ රක්ෂස්ථානය බවට දේව වචනය සවිසන්නෙන් කුමක් ද?

දෙවියන්වහන්සේ අපගේ රැකවරණය කියා බයිබලය නැවත නැවතත් අපට කියා දෙයි.

''මාගේ පර්වතයාණ් මාගේ ගෑලවීමාණ් උන්වහන්සේය් පමණක්ය. උන්වහන්සේ මාගේ බිලණාවුවිය; මම කිසිසේ සෙයින් නොසෙල්වෙන්නෙමි. (ගීතාවලිය 62:2)

''දෙවියන්වහන්සේ අපේ යරණ හා ශක්තියය. දුකෙදී ඉතා උන්වූ සිහිවන්ය." (ගීතාවලිය 46:1)

''උන්වහන්සේ මාගේ රක්ෂාස්ථානය, මාගේ බිලණාවුවිය; මා සිහින් විශ්වාස කරන මාගේ දෙවියන් වහන්සේ යයි ස්වාමීන් ගැන කියන්නෙමි." (ගීතාවලිය 91:2)

''ජනයෙනි, සෑම වීටම උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරව්; උන්වහන්සේ ඉදිරියේ හදවත් වගුරුවව්, දෙවියන්වහන්සේ අපව රක්ෂ ස්ථානයක්ය." (ගීතාවලිය 62:8)

''ස්වාමීන්වහන්සේ යහපත්ය, විපත්තී දවසෙදී බිලණාවුවිය; උන්වහන්සේ තමන්ව කෙරෙහි විශ්වාස කරන්නන් දන්නා සේක." (නාහූම් 1:7)

''ස්වාමීන්වහන්සේගේ නාමය බිලණාවුවිය. ඊට්ම්ස්ය එහි දුව ගොස් ගුරක්ෂිත වෙයි." (ගීතෝත්පදේශ 18:10)

''දෙවියන්වහන්සේගේ කියවූ කිසි පරිත්‍රය; උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නන්ව උන්වහන්සේ පලිහයි." (ගීතෝත්පදේශ 30:5)

කෙතරම් ප්‍රබල සහතිකයක්ද!

දෙවියන්වහන්සේ යනු අපව ඉඳහිට පමණක් රැකබලා ගන්නා දෙයක් නොවේ; උන්වහන්සේ යෑම විටම අපගේ රැකවරණයයි.

පුද්ගලිකව ඇසිය යුතු ප්‍රශ්නයක්!

යෑබවින්ම දෙවියන්වහන්සේ පමණක්ම අපගේ රක්ෂස්ථානයය කියා අප අතරින් කී දෙනෙකුට කිව හැකිද?

මෙම පදය මා මෙහෙනයි කරන විටදී ඔව් හැකි කියාවු කාරණයක් නම්; දෙවියන්වහන්සේ යෑමවින්ම අපගේ රක්ෂස්ථානයක්ව සිටිනවාද කියාය.

පරණ සිරිසුනෙ සඳහන් කර තිබෙන්නාවු ආරක්ෂා නුවරවල් ගැන ඔබ කියවා බැලුවෙමි. එපේම ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින් අපව ස්ථිර රක්ෂස්ථානයක් තිබෙන බව ඔව් හැවසිමට හැකිය.

ආරක්ෂා නුවරවල්

ඊශ්‍රායෙල් සෙනඟට දෙවියන් වහන්සේගේ සොඅරාන්දු දේශය දුන් කල්හි ලෙවිවරුන්ව අනෙක් ගෝත්‍ර වලට වැඩුණු ලෙස උරුමයක් කොලැබුණේ නැත. *''මක්නිසාද ලෙවිවරුන්ට තුඹළා අතරෙහි කොටසක් නැත; ඔවුන්ගේ උරුමය වනාහී ස්වාමීන්වහන්සේගේ ප්‍රජාත නානාතුරය....." (යෙහොෂුවා 18:7)*

සෙසෙයි වෙනත් යෑම ගෝත්‍රයකටම වැඩුණා වූ ඉඩමෙන් කොටසක් ලෙවි වරුන්ව කියා වෙන්කර තිබුණි. එපේම යම්කිසි ඒශ්‍රායලයෙක්ම ඔවුන්ව නුවරවල් 48ක් වැඩුණි. ඉන් 6ක් ආරක්ෂා නුවරය කියා නම් කරනු වැඩිය. ඒශ්‍රායල් රජවසි යෑමෙක් කිසියම් වරදක් කර එයින් මිනිසෙක් මැරුවේ නම් එක් නුවරකට සියලහාත් ඔවුන්ව එයින් ආරක්ෂා වීමට හැකිය.

ආරක්ෂා නුවරවල් පිහිටුවීමේ අරමුණ!

මෙම ආරක්ෂා නුවරවල් වල තිබුණු අරමුණ ගැන ගණන් කතාව 35:22-28 දක්වා ඇති කොටසින් හැඟෙදිලි වෙයි.

යම්කිසි තව කෙනෙක්ව නොදන්නාකමින් බැරුවශයෙන් එවැනි පුද්ගලයා මහුව වැටෙන මරණ දඬුවමෙන් මිදීමට මෙම නුවරවල් වලින් එකකට ගොස් ආරක්ෂා වීමට පුළුවන්. එවිට ඔහු ළඟ ලේ වැගිරීම ගැන කිසිදෝෂ වෙයි. එපේම එම තැනැත්තා කිසිදෝෂ ද නැද්ද කියා යහාව විසින් තීරණය කරන ලබයි.

මරණය අහම්බෙන් සිදු වුවාය කියා තීරණය කළා නම්, ඔහිමිරුවා උදෙසා කැපවුණාවු උත්තම ප්‍රජාකයාගේ මරණය දක්වා මහුව ආරක්ෂිත නගරයෙහි රැඳී සිටිමට හැකියි. කෙසෙයි වෙනත් ව් සාක්ෂ්‍ය වැදගත් කොහාන්දියක් තිබුණි: මහුව නගරයේ සිමාව තුළ සමඟකක් රැඳී සිටිමට සිදුවෙයි.

එනමුත් මහු ආරක්ෂානුවරින් පිවතව සියලහාත් තවදුරටත් මහු ආරක්ෂාව යවකත් නොසිටින හෝයා, මහුව කිසියම් කෙනෙකුට බැරිය හැකිය. නමුත් උත්තම ප්‍රජාකයාගේ මරණයෙන් පසුව මහු සිටි ස්ථානයට කැවින යාමට මහුව නිදහස තිබේ.

කොතරම් බලවත් ආරක්ෂිත ස්ථානයක නින්තූරයක්ද!

ආරක්ෂිත නුවරවල් වලින් අපි ඉගෙන ගන්නේ කුමක්ද?

1). ආරක්ෂාව ලැබයි.

කිසියම් පුද්ගලයෙක්ව නොදැනුවත්කමින් බැරුවශයෙන් එම පුද්ගලයාව ආරක්ෂා නුවරවලින් රැකවරණයක් ලැබේ. මහු එම ලේ වැගිරීම ගැන කිසි විනිශ්චයක් ලැබෙන තුරු එම ස්ථානයෙහි ආරක්ෂිතව සිටිය හැකිය.

2). ආරක්ෂා නුවරවල්හිදී මවුන්ට ආරක්ෂාව සපයනු ලබයි.

නොදැනුවත්කමින් හෝ අහම්බෙන් කෙනෙකුව මරණයට හෝ කළහාත් එම ආරක්ෂා නුවරවල සිටීමට මහුව ඉඩ ප්‍රස්ථාව තැත.

3).මවුන්ව ප්‍රවේශ විය හැකිය.

අවශ්‍ය සියලු දෙනාවම සාධාරණ ලෙස ප්‍රවේශ විය හැකිවන සේ දේ එම නගර 6 රව පුරා විහිදී තිබුණි.

4). ඊශ්‍රායල්වරුන්ට පමණක් නොව ඕනෑම පුද්ගලයෙකුට මෙම නුවර වලට ප්‍රවේශ විය හැකිය.

එම නගර ඊශ්‍රායල්වරුන්ව පමණක් නොව ඔවුන් අතර ජීවත් වූ විදේශිකයන්ව සහ ආගන්තුකයින්වද අදාළ විය.

5). ආරක්ෂාවට සීමාවන් තිබුණි.

ආරක්ෂිත නගරවලව සලා සිය පුද්ගලයා එහි සීමාවන් තුළ රඳී සිටිය යුතුය. නගරයෙන් බිවවීම යනු ආරක්ෂිත ස්ථානයෙන් ඉවත්වීමයි.

6). ආරක්ෂාව උත්තම පූජකයාගේ ජීවිතයට සම්බන්ධ විය.

යේවිය කළ උත්තම පූජකයාගේ මරණය දක්වා ඔහු මරුවා නගරය තුළ රඳී සිටිය යුතුය. ඉන් පසුව ඔහුව තම උරුමයට ආපසු යා හැකි විය.

හඳිසි අනතුරකින් මියගිය කෙනෙකුට ආරක්ෂාව ලොයාගත හැකි නගරයන් ඇති බව දැනගෙන තම ජීවිතයේ බේරා ගැනීමට දිව යන විට ඇතිවන සහනය ඔබට සිතා ගත හැකිද?

ආරක්ෂිත නගර හය!

දෙවියන්වහන්සේ යෝර්දාන් නදිය දෙපස තුන බැගින් ආරක්ෂිත නගර රක් සිහිවෙව්වෝය.

- බටහිරින් යෝර්දාන
  - කෙදෙශ් - උතුරු ප්‍රදේශයේ නෆ්තලි කඳුකරයෙහි
  - ෂෙකෙම් - මධ්‍යම කලාපයේ එප්‍රායිම් කඳුකරයේ (ගලිලය)
  - හෙබ්‍රොන් - දකුණු කලාපයේ යුදාහි කඳුකරයේ (කිරියත් - අර්බා)
- නැගෙනහිරින් රාමොත් - මධ්‍යම පළාතේ ගාද් ප්‍රදේශයේ බෙසෙර් - දකුණු කලාපයේ, රූබන් දේශයේ ගෝලාන් සිහිවී,

මෙම නගර ඉතා යෝග්‍ය ලෙස ස්ථානගත කර තිබුනේ ඔවුන්ට රැකවරණයට ලබා ගැනීම සිහිසය.

නව ගිවිසුමේ රැකවරණය!

අද දින ඇදහිලිවන්තයින් වශයෙන් අපට මෙම රැකවරණය සිළිබඳව තිබෙන්නා වූ සිතන්තරයේ තේරුම කුමක්ද?

අපගේ අවසන් රැකවරණය ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පමණක්ය.

පැරණි ගිවිසුම යටතේ ආරක්ෂිත නගර, තාවකාලික ආරක්ෂාව ලබා දුන්න නමුත් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට ඊටත් වඩා උතුම් දෙයක්ලබා දී ඇත.

උන්වහන්සේ අනතුරකින් මිය ගියේ නැත.

"නුමුත් දෙවියන් වහන්සේ අප කෙරෙහි ඇති තමන් වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙනි." *(රෝම 5:8)*

ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණය ජයගෙන නැවත නැගිටිවේවිය.

තුමික උත්තම පූජකයන්ගේ ජීවිතය නිමවී අවසන් වන්නේය. නමුත් අපගේ ප්‍රධාන පූජකයා සදහටම ජීවත් වන්නේය. එබැවින් අපගේ රැකවරණය තාවකාලික වන්නේ නැත. අපගේ රැකවරණය සදාකාලයටම පවතින්නේය. රෝම 6:9 හි මෙසේ පවසයි;

"නවද මළවුන්ගෙන් නැඟිටුවනු ලැබුවා වූ ක්‍රිස්තුස්වහන්සේ නවත් නොමැරෙන බවත් මරණය උන්වහන්සේ කෙරෙහි නවත් බලය නොපවත්වන බවත් අපි දන්නා බැවිනි," මෙය කොතරම් මහිමාන්විත සහතිකයක්ද!

අප වටුකාරයන්ව සිටියදී දෙවියන් වහන්සේගෙන් ඇත්ව උන්වහන්සේගෙන් වෙන්ව සිටියදී වචා ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ රැකවරණය වූ බවක.

නමුත් උන්වහන්සේ අප දුරස්ව සිටිනවාට කැමති නැත. උන්වහන්සේ වෙනව ලංවෙන්නය කියා උන්වහන්සේ වචසයි. උන්වහන්සේව සම්පූර්ණයෙන්ම විශ්වාය කිරීමට අපට ආරාධනා කරන බවක!

උන්වහන්සේ අපට ආරාධනා කරන්නේ උන්වහන්සේව අපගේ රක්ෂස්ථානය කරගැනීමටය. අපගේ බලකොටුව සහ රැකවරණය කරගන්නා සිකියය.

"ස්වාමීන් කෙරෙහි විශ්වාය කරන්නෝ සෙලවිය නොහැකි වූ සදාකල් පවතින්නාවූ සියොන් කන්ද මෙනිස." *(ගීතාවලිය 125:1)*

කවත් බයිබල් පරිවර්තනයක; "උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබුවහොත් අප පරාජය නොවෙමු" කියා සඳහන් කර ඇත - NLT

....Contd. to page 6



ඉතා හදිසි දැනුම් දීමක්!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Call: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echooffiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රකිරාවිය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් මබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රකිරාවිය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර මබගේ නම, ලිපිනය, විදුලුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිඛිතයකින්, විදුලුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබුන්නට සලස්වන්න.

මබගේ සහයෝගය අපට මබට මහඳින් සේවය සලසා දීමට උපකාරී වේවි!

යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
ප්‍රබුදු කිරීම (2 තිමෝති 1:6)

ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

නොවැ:19 - කැපවී සේවය කරන සබත් පාසල් ගුරුවරුන් නිසා, ස්තුති කරන්න.

නොවැ:20- අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල පවත්වන ඉරුදින සබත් පාසැල් වලට අලුත් දරුවන් ලබාදී ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

නොවැ:21 - අපගේ රෝහල් සේවයේ ඛාස්කම් සිදුවෙන නිසා දෙවියන්වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

නොවැ:22- කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව හරහා දෙවියන් වහන්සේගේ සේවයට සහාය දක්වන කැප වූ සහකාර සංස්කරුවන් නිසා, ස්තුති කරන්න.

නොවැ:23 - අපගේ සංවිධානයට නව සේවකයින් ලබාදී ආශිර්වාදය කළ නිසා, ස්තුති කරන්න.

නොවැ:24- අපගේ සභාවේ නව ඇදහිලිවන්තයින්ට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

නොවැ:25- අපිගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ විදුහල්පතිතුමා, ගුරුවරුන් සහ අනිකුත් කාර්ය මණ්ඩලයට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

නොවැ:26- විවිධ සේවාවන් හරහා සුභාරංචිය ප්‍රකාශ කිරීමට අපගේ ප්‍රධාන දේවගැති තුමාගේ කැපවීම නිසා, ස්තුති කරන්න.

නොවැ:27- අපගේ සියලුම කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල් නිසා, ස්තුති කරන්න

නොවැ:28- අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට සහ නෙගෙම්බියා බයිබල් විද්‍යාලයට උන්වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න

නොවැ:29 - ලෝකය පුරා ශුභාරංචිය නොගිය දේශයන් වෙතට ශුභාරංචිය ගෙන යාමට කැපවී සිටින මිෂනාරි වරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

නොවැ:30- ලොව පුරා සිටින ජනතාව වෙතට ශුභාරංචිය ගෙනයාමට දොරවල් විවෘත කර තිබෙන නිසා, ස්තුති කරන්න.

දෙසැ:01- ශ්‍රී ලංකා දේශය තුළ ශුභාරංචිය ප්‍රකාශ කිරීමට ලැබී තිබෙන නිදහස නිසා, ස්තුති කරන්න.

දෙසැ:02- ශ්‍රී ලංකා දේශය තුළ විවිධ කිතුනු නිකායන් එක්ව වැඩ කිරීමට දෙවියන් වහන්සේ දී තිබෙන කරුණාව නිසා, ස්තුති කරන්න.

දෙසැ:03- ශ්‍රී ලංකා දේශය තුළ සංවර්ධන කටයුතු කරගෙන යාමට උපකාර කර තිබෙන නිසා, ස්තුති කරන්න.

යාච්ඤා කිරීම් සඳහා කරුණු

දෙසැ:04- අපගේ ප්‍රධාන දේවගැති තුමා සහ ඔහුගේ පවුලේ සියලුදෙනාගේ ආරක්ෂාව සහ සැපයීම උදෙසා, ඒකඡ යාච්ඤා කරන්න.

දෙසැ:05- අපගේ දේශයේ සියලුදෙනම පුරවැසියන් අතර එකමුතුකම ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:06- අපගේ සහකාර කණ්ඩායම්වරුන් සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාදය ලැබෙන ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:07- ලෝකයේ සියලු රටවල සිටින ජනාධිපතිවරුන් අගමැතිවරුන් සහ සියලුම රජයේ නිලධාරීන්ගේ ආරක්ෂාව ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:08- අපගේ නෙගෙම්බියා බයිබල් විද්‍යාල සහ ශාන්ත පාවුලුරු මේට්‍රිකියුලේෂන් පාසලේ සියලුදෙනම වැඩ කටයුතු උදෙසා, යාච්ඤා කරන්න.

දෙසැ:09- අපගේ රාජ්‍ය සම්බන්ධීකාරකවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට යහපත් සුවය සහ ආරක්ෂාව ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:10- අපගේ නක්තල් සැමරුමට සහ 2027 නව වසරේ රාත්‍රී දේව මෙහෙය උදෙසා, යාච්ඤා කරන්න.

දෙසැ:11 - ලෝකවාසී සියලු ජනතාව හා රටවල් අතර සාමය සහ සමගිය ඇතිවන ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:12- මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටින පුද්ගලයින් පසුකැවිල්ලට පැමිණෙන ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:13 - ඉන්දියාව තුළ හා ලොව පුරා ශුභාරංචිය නොගිය ස්ථාන වලට ශුභාරංචිය ගෙන යාමට දෙවියන් වහන්සේගේ කරුණාව ලැබෙන ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:14- ලොව පුරා සිටින සියලුදෙනම සභාවන්ට සහ දේව ගැතිවරුන්ට උන්වහන්සේ බලවත් ආශිර්වාදය ලැබෙන ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:15-- ලෝකය පුරා තිබෙන යුද ගැටුම් නතරවී සියලුම ජාතීන් අතර සාමය සහ සහයෝගය ඇතිවන ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:16--කරුණා කරුණියන් අතර සියදිවි නසාගැනීමේ ආත්මය නිදහස්වන ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:17--ශ්‍රී ලංකා දේශයේ රාජ්‍ය පාලකයන් සහයෝගිකාවයෙන් යුතුව රට පාලනය කිරීමට හැකි වන ඒකඡ, යාච්ඤා කරන්න.

දෙසැ:18-- ශ්‍රී ලංකා දේශයේ කිතුණු නිකායන් වල තිබෙන වැරදි ඉගැන්වීම් ඉවත් වී දේව වචනය නිවැරදිව උගන්වන්නා වූ දේව දාස, දාසීන් හැඟිවන ඒකඡ, යාච්ඤා කරන්න.

....Contd. from page 4

ප්‍රිය සහෝදරයා සහෝදරිය, දෙවියන් වහන්සේ ඔබගේ තක්ක්වියන් දනී. ස්වාමීන්වහන්සේ කෙතරම් යහපත්දැයි රස බලා දැනගත්තා ලෙස මම ඔබව දිරිමත් කරමි.

අපගේ විශ්වාසය දෙවියන්වහන්සේ කෙරෙහි ඇති විට කුණාටු පැමිණියත් සුළං හමා ආවත් තවත් බොහෝ දේවල් සිදුවුවත් අපගේ රැකවරණය විශ්වාසවන්තව පවතින බැවින් අපගේ අත්තිවාරම නොසෑලී පවතී.

විකල්ප රැකවරණය බොරුවේ රැකවරණය!

නමුත් බයිබලය තවත් ආකාරයකට රැකවරණය පිළිබඳව අපට අනතුරු අඟවයි - බොරුවේ රැකවරණය.

යෙසායා 28:15 මෙසේ පවසයි;

"..... මෙත්තියාද අපි බොරුව අපේ රක්ෂස්ථානය කරගෙන වංචා කමෙහි සැඟවී සිටීමු යයි නුඹලා කීවහුය."

දෙවියන් වහන්සේ ඔවුන්ගේ රැකවරණය කර ගැනීම වෙනුවට මිනිසුන් බොහෝ විට තම විශ්වාසය තබන්නේ ඔවුන්ව ගලවා ගැනීමට නොහැකි දෙයකටය.

බොරුවේ තියා කවුද කියා අපි දනිමු.

තාවකාලික, බිඳෙන සුළු සහ කල්පවතින ආරක්ෂාවක් ලබා දිය නොහැකි දේවල් කෙරෙහි විශ්වාසය තැබීමට සාතන් මිනිස් සංහතිය රවටා ඇත.

අපගේ ව්‍යාජ රක්ෂස්ථානය බවට පත්ව ඇති සමහර දේවල් මොනවා ද?

ධනය, කීර්තිය, අධ්‍යාපනය, බලය, තනතුරු, දක්ෂතාවයන්, සාර්ථකත්වය, සබඳතා සහ ද්‍රව්‍යමය දේපළ යනාදියයි.

මේ කිසිවක් කිසිවිටක නරක නැත.

දෙවියන්වහන්සේ අපගේ රක්ෂස්ථානය කර ගැනීම වෙනුවට, ඔවුන් ව්‍යාජ දේ රැකවරණය බවට පත්කරගන්නා විට අනතුරක් පැමිණෙයි.

නිර්මාණය කරන ලද දෙයක් මැවුම්කරුගේ ස්ථානය ගත්විට, එය ව්‍යාජ රැකවරණයක් බවට පත්වෙයි.

එය බොරුවේ නවාතැනක් බවට පත්වන අතර සෑම ව්‍යාජ රැකවරණයක්ම අවසානයේ අසාර්ථක වනු ඇත.

යෙසායා 28:17-18 පද අපට බිය උපදවන චිත්‍රයක් ලබාදෙයි;

"මම විනිශ්චය නූලටද ධර්මිෂ්ටකම ලඹයද කොට පාවිච්චි කරන්නෙමි. බොරුවේ රක්ෂස්ථානය ගල් වර්ෂාවට පහ වන්නේය. සැඟවෙන ඉඩමද වතුරට යටවන්නේය. මරණය සමඟ තිබෙන නුඹලාගේ ගිවිසුම අවලංගු වන්නේය. පාතාලය සමඟ තිබෙන නුඹලාගේ පොරොන්දුව පවතින්නේ නැත; ගලාඑන විපත පැමිණෙන විට නුඹලා එයින් පාගා දමනු ලබන්නහුය."

බොරුව මත ගොඩනැගුණු සියල්ල අවසානයේදී බිඳ වැටෙනු ඇත.

නමුත් දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා - අපට ඊට වඩා විශිෂ්ට දෙයක් තිබේ!

අපට ජීවමාන ගැලවුම්කරුවෙක් සිටී!

අපට ස්ථිර අත්තිවාරමක් තිබේ! අපට ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නම් මුල්ගලක් තිබේ!

යෙසායා 28:16 හි පවසයි;

"ඒ නිසා ස්වාමී වූ දෙවියන් වහන්සේ මෙසේ කියන සේක: බලව, මම අත්තිවාරමක් පිණිස ගලක් එනම් පරීක්ෂා කරන ලද ගලක්, යටි අත්තිවාරමක්වූ අනර්ඝ කොනේ ගලක් තියෙන්හි තබමි."

මොන තරම් වෙනසක්ද!

බොරු රක්ෂස්ථානයන් කඩා වැටෙනු ඇත. නමුත් ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට ඇති රැකවරණය කිසිදා අසාර්ථක නොවෙනු ඇත.

අපගේ රැකවරණය කොහේද? අපගේ රැකවරණය කුමක්ද?

අප තේරුම් ගත යුතු වැදගත් දෙයක් තිබේ. ආරක්ෂිත නගරයකට පලා ගිය පුද්ගලයාට නගරය තුළම රැඳී සිටීමට සිදුවිය. ඔහු නිතර මහාම එහි සිමාවෙන් පිටතට ගියහොත් ඔහු තමාවම අනතුරේ හෙළනු ඇත. එලෙසම

ඇදහිලිවන්තයන් වශයෙන් අප ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටීමට ඉගෙන ගත යුතුය.

ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙසේ පැවසූ සේක;

"මා තුළ පැවතීයල්ලා, මමත් නුඹලා තුළ පවතින්නෙමි ....." (යොහාන් 15:4)

අපට කරදරයක් වූ විට ඉඳ හිට් දෙවියන් වහන්සේ වෙතට දිව යාමෙන් සහ අර්බුදකාරී අවස්ථාවන්වලදී අපගේ පැරණි කුම්වලට නැවත හැරීමෙන් අපගේ ආරක්ෂාව සොයාගත නොහැකිය.

දෙවියන්වහන්සේ සමඟ තිබෙන සම්බන්ධතාවය අපට වැදගත් වන අතරම සහාව සහ දේව ගැතිවරයෙකු සිටීමද එහා සමානව වැදගත් වේ.

උන්වහන්සේ තුළ රැඳී සිටීමට අපව කැඳවනු කැඳවා තිබේ.

දෙවියන්වහන්සේ අපට උන්වහන්සේගේ සහාව තෑගියක් ලෙස ලබාදී තිබෙන්නේ අපව ශක්තිමත් කිරීමට, දිරිගැන්වීමට, නිවැරදි කිරීමට, යාච්ඤා කිරීමට සහ සහාය වීමට හැකි අධ්‍යාත්මික පවුලක් ලෙසටය.

අද ලෝකය, සහාවට පැමිණීම, අධ්‍යාත්මික වගකීම යල් පැහ ගිය හෝ අත්‍යවශ්‍ය දෙයක් ලෙස සැලකිය හැක.

නමුත් දෙවියන් වහන්සේගේ නිර්මාණය වෙනස්ය.

අපට එකිනෙකා අවශ්‍ය වෙයි.

දේව වචනය විශ්වාස කරන සහාවක මුල්බැස සිටීම සහ දේව භක්තික ආත්මික නායකයින්ගේ සහ දේවගැති වරයෙකුගේ රැකවරණයක් තිබීමද ඉතා වැදගත් වෙයි අපිට අවශ්‍ය වන්නේ අප සමඟ යාච්ඤා කරන අපව දිරිමත් කරන අයයි. දෙවියන්

වහන්සේගේ සත්‍ය අපව කතා කරන අවශ්‍යතාවයන් ඇති අවස්ථාවන්වලදී අප හා අපගේ පවුල සමඟ සිටින්නාවූ අයයි.

මේ ගමන අප තනියම යාමට උන්වහන්සේ සුදානම් කර නොමැත.

ආරක්ෂිත ස්ථානයක් නිබීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

ආරක්ෂිත කුවරවල් වලින් අපට ඉගෙන ගත හැකි පාඩම් මතක් කර ගනිමු.

1. නොදැනුවත්කමින් මරණයක් සිදුකළ පුද්ගලයෙකුට ආරක්ෂිත ස්ථානයට පලා යා හැකිය.

2. කාරණය නිසි ලෙස විනිශ්චය කර, පසුව ආරක්ෂිත නගරය තුළ ආරක්ෂාව සැපයීම.

3. ලේ වල පළිගන්නා නගරයට ඇතුළු වී එම පුද්ගලයාගේ ජීවිතය නැති කිරීමට නොහැකිය.

4. ආරක්ෂාවට සීමාවක් තිබුණි , පුද්ගලයා ආරක්ෂිත නගරය තුළ රැඳි සිටිය යුතුය.

5. උත්තම පූජකයාගේ මරණය දක්වා ආරක්ෂාව පැවතුණි.

6. එම පුද්ගලයාගේ යාච්ඤාව කුමක් වන්නට ඇතිද? උත්තම පූජකයාගේ දීර්ඝායුෂ සඳහා කරන යාච්ඤාවක් විය හැකිද? සමහර විට බොහෝ දෙනා ආශා කරනු ලැබුයේ අවසානයේ තම උරුමයට නැවත පැමිණිය හැකි දිනය එනතුරුයි.

ඇදකිලිවන්කයින් ලෙස අපව නිත්තුරය අලංකාර වන්නේ මෙකැනදීය.

වාසනාවකට මෙන්, අප දැන් තුගෝලිය නගර හයකට පමණක් සීමා වී නැත.

අප සතුව ඊට වඩා අනන්ත ගුණයකින් උසස් දෙයක් තිබේ!

එනම්, අපගේ රැකවරණය ලෙස ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප සතුව සිටින සේක.

"..... අප ඉදිරියේ තබා තිබෙන බලාපොරොත්තුව අල්ලා ගැනීමට ආරක්ෂාව පිණිස පලා ආවා වූ අපට මහත් ධෛර්යයක් ලැබෙන පිණිසය." *(හෙබ්‍රෙව් 6:18)*

අප රැකවරණය පිණිස පලා යනු ලැබුවේ භෞතික නගරයකට නොව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතටය.

ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ:

★ උන්වහන්සේ වෙතට ඇදකිල්ලෙන් පැමිණෙන්නාවූ සියල්ලන්ට උන්වහන්සේ රක්ෂාස්ථානයයි.

★ උන්වහන්සේගේ ප්‍රේමය සහ ආරක්ෂාව සියලුම මනුෂ්‍යයන් කෙරෙහි තිබේ.

★ අපගේ ශ්‍රේෂ්ඨ උත්තම පූජකයා සදහටම ජීවත්වන බැවින්, උන්වහන්සේගේ ආරක්ෂාව තාවකාලික නොවේ.

★ උන්වහන්සේ අපගේ බලකොටුව හා ශක්තිමත් කුළුණයි. සතුරාට අපව ස්පර්ශ කළ නොහැකිය.

★ උන්වහන්සේ අපගේ මිල්ගල හා අපගේ ස්ථිර අත්තිවාරමයි. "නුඹට අකගසන්නා ඔගේ ඇසේ කළු ඉංගිරියාවට අත ගසන්නේ ය." කියා ස්වාමීන් වහන්සේ පවසයි.

★ අපගේ විශ්වාසය උන්වහන්සේ පිට තබන විට අපව උන්වහන්සේ වෙත තබා ගනී.

★ අප නිතාමෙතාම පව් කලත් නැතත් දෙවියන්වහන්සේ අපගේ රක්ෂස්ථානයයි. මන්ද උන්වහන්සේ අප වෙනුවෙන් මිය ගිය අතර උන්වහන්සේගේ රුධිරය කරන කොට ගෙන අපගේ සියලු පාප වලින් අපව පවිත්‍ර කළේය. උන්වහන්සේගේ කරුණාව අපට සෑහෙයි.

ප්‍රශ්නය වන්නේ අපගේ තත්ත්වය කොතරම් දුෂ්කර ද යන්න නොවේය.

අප කළ යුත්තේ ස්වාමීන්වහන්සේ වෙතට පැමිණීම පමණි. මන්ද උන්වහන්සේ තුළ අපට රැකවරණය, ශක්තිය හා ආරක්ෂාව ලැබේ.

උන්වහන්සේගේ අභිමුඛත්වයට එන්න!

ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට මෙම ආරාධනාව ලබාදෙයි.

"මා වෙතට පැමිණෙන කිසිවෙකු කිසිවිටෙකත් අහක නොදමනු ඇත" *(යොහාන් 6:37)*

කොතරම් අනර්ඝ ආරාධනාවක්ද!

....Contd. to page 9

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for admission!
Medium :Tamil (Part Time)
Hindi (Part Time)
Diploma in Theology & Bachelor of Theology
Qualification : 10th Standard & above
Contact :
The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
Recognised by International Christian Leaders & Senior Pastors for the past 57 years



PIT TO PALACE

පාලු වලකින් මාලිගාවට

"...කියවන්නා තේරුම් ගනීවා...." *(මතෙව් 24:15)*

"නමුත් මම දුප්පත්මි, දිළින්දෙමි; එහෙත් ස්වාමීන්වහන්සේ මා සිහි කරනසේක....." (ගීතාවලිය 40:17)

මීට වසර පනහකට පමණ පෙර චෙන්නයි හි මහා පිබිදීමේ රැස්වීමක් පැවැත්විණි. එයට දකුණු ආසියාවෙන් සමහර ජේෂ්ඨ දේශකයින් පැමිණ සිටියහ. දෙවියන් වහන්සේ ඔවුන් හරහා මහා ප්‍රාතිහාර්යයන් සිදුකළ සේක. එහිදී විශාල සෙනඟක් බලවත් භාස්කම් අත්දුටු අතර ඔවුන්ගේ ජීවිතයට පළමුවරට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය අසාසිටියේය. එම රැස්වීමේ දී මා ස්වේච්ඡා සේවකයෙකු ලෙස ඔවුන්ට උදව් කරමින් සිටියෙමි.

එම රැස්වීමේ අවසාන දිනයෙන් පසුව රැස්වීම සාර්ථකව පැවැත්වීම සඳහා උදව් උපකාර කලා වූ අමුත්තන් සහ සේවකයින්ට කුඩා රැස්වීමක් පැවැත්විණි. හදිසියේම දකුණු ආසියාවෙන් පැමිණි ප්‍රධාන අමුත්තා මා හට කතාකර මා ගැන කොරතුරු ඇසුවේය. බැතර් සවිකිරීම, නව මිතුරන් ගෙන එම සහ පිබිදීමේ රැස්වීමට සහභාගී වූ අයට උපකාර කිරීම මා ඉතා අවංකව හා වෙහෙස මහන්සි වී ඉටුකළ නිසා ඔහු එය ඉතා අගය කළේය.

මා පැමිණියේ කොහෙන්දැයි කියා ඔහු මගෙන් විමසූ අතර ඔහු ඉන්දියාවෙන් පිටත්ව යන අවස්ථාවේදී සඳුදා දින පාන්දර 4.00 ට ගුවන්තොටුපළේදී ඔහුව හමුවීමට හැකිදැයි කියා මගෙන් ඇසීය. මා සතුව පවතින්නේ ඉතා පැරණි බයිසිකලයක් පමණක් නිසාත් මගේ නිවසේ සිට ගුවන් තොටුපළ වෙතට ළඟා වීමට 25kmක් පමණ තිබෙන නිසාත් උදෑසනම ගුවන් තොටුපොළ වෙතට පැමිණීමට ඉතා අපහසු බව මා ඔහුට පැවසුවෙමි.

ඒ ක්ෂණිකව ඔහු වටපිට බැලූ විට මෙම නගරයේ සිටි ජ්‍යෙෂ්ඨ ඉවැන්ජලිස්තවරයෙකු හමුවී ඔහුගේ නමින් කතා කර, 'මේ සහෝදර සෑම් සෙල්වා රාජ් ස්වේච්ඡාවෙන් ඉතා කැපවීමෙන් යුතුව හොඳින් වැඩ කළ ආකාරය මා දුටුවා . ඔහු තුළ මා විශේෂ යමක් දුටුවා. එමනිසා මා ඉන්දියාවෙන් පිටත්ව යාමට පෙර ගුවන් තොටුපළේදී ඔහු සමඟ යම් කාලයක් ගත කිරීමට කැමැතියි. ඔහු ඉතා දුප්පත් නිසා හෙට උදේ පාන්දර ගුවන් තොටුපලට පැමිණීමට පහසුකමක් ඔහුට නොමැති නිසා, ඔබ මාව ගුවන් තොටුපළ වෙතට රැගෙන යන නිසා ඔබගේ මෝටර් රථයත් ඔහුවත් ගුවන්තොටුපල වෙතට රැගෙන එනවා නම් මම සතුටුයි. නමුත් එම ඉවෙන්ජලිස්ට්වරයා මා කෙරෙහි කෝපයට පත් වී ප්‍රධාන අමුත්තා අමතා; 'මේ මනුෂ්‍යයාව ගුවන් තොටුපළ වෙතට රැගෙන ඒමට මගේ මෝටර් රථය් ඉඩක් නැහැ, ඔහු ගුවන් තොටුපළට එන්නේ නැහැ.' කියා පවසනු ලැබීය. එවිට දේශකයා කතා කොට; "ඔබ සමඟ ගුවන් තොටුපලට පැමිණීමට තවත් අය සිටිනවාද?" කියා ඇසුවේය. එවිට ඔහු පිළිතුරු දෙමින්; ' මා සමඟ කවුරුත් එන්නේ නැහැ, ඒත් මේ දුප්පත් මිනිහාට උදව් කරන්න මට බැහැ.'

දෙවියන්වහන්සේගේ සේවකයෙක් වූ ප්‍රධාන දේශකයා මෙය ඇසූ විට මහත් කම්පනයට පත්විය. ඔහු මට කතාකර මගේ හිස මත ඔහුගේ අත තබා කඳුළු සලමින් දෙවියනවහන්සේට යාච්ඤා කරමින්, මට දිව්‍යමය ආශිර්වාදයන් ද ලබාදෙන ලෙස ඉල්ලා යාච්ඤා කළේය. ඔහු තවදුරටත් මට මෙසේ පැවසීය; "මගේ සහෝදර සෑම්, ඔබ අද උතුම් වූ දෙවියන් වහන්සේගේ සේවය කරන්නාවූ ඉතා නිහතමානී සේවකයෙකු බව මම දනිමි. මම ඔබට සහ ඔබගේ සේවයට සමෘද්ධිය ප්‍රකාශ කරමි. මා සේවය කරන දෙවියන් වහන්සේ දැන් සිට ස්වර්ගයේ කවුළු විවෘත කර ඉන්දියාව පුරාම ඔබගේ සේවයේ සඳහා බොහෝ මෝටර් රථ සහ අනෙකුත් සියලුම අවශ්‍යතාවයන් ඔබට සපයමින් ආශිර්වාද කරනු ඇත. හෙට උදෑසන ගුවන්

MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Children School : 11.00 a.m. Sunday**
18. **Youth Meeting : 11.00 a.m. Sunday**
19. **Elders for Christ Meeting : 11.00 a.m. Sunday**
20. **Fellowship Lunch : 01.00 p.m. Sunday**
21. **Telugu Service : 4.00 p.m. Sunday**
22. **Hindi Service : 5.00 p.m. Sunday**
23. **Tamil & English Service : 6.00 p.m. Sunday**
24. Feedback Time : 8.00 p.m. Sunday
25. Women's Prayer : 5.30 p.m. Wednesday
26. Men's Prayer : 7.00 p.m. Friday
27. Discipleship Meeting : 6.00 p.m. Saturday
28. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
29. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
30. Workers Meeting : 5.30 p.m. First Saturday
31. Parents' Prayer : 4.00 p.m. First Sunday
32. Night Prayer : 9.30 p.m. Third Friday
33. Fasting Prayer : 9:30 a.m. Second Saturday
34. Holy Communion : Second Sunday Service
35. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
36. Staff Devotion : 9.00 a.m. daily
37. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

කොටුපොළට ඔබව රැගෙන යාමට අකමැති වූ ඒ සහෝදරයාට ඔබ වෛර නොකරන්න. කියා ඔහු පවසනු ලැබිය.

මෙම අත්දැකීම මට වේදනාකාරී අත්දැකීමක් ගෙන දුන්නේ නැත. නමුත් දෙවියන්වහන්සේ කම සේවකයා මාර්ගයෙන් දුන් ආශීර්වාදමක් වචනය නිසා මම ඔහුට සත්කාරවන්ත වුනෙමි. දිනයන් ගතවී ගොස් ඇත. නමුත් දෙවියන්වහන්සේ මාව ඔහුගේ මතසේ තබා ගැනීමට ඉතා විශ්වාසවන්ත විය. පසුව දෙවියන් වහන්සේ මට වාහන සහ මගේ දේව සේවය සඳහා අවශ්‍ය සියලු උපකරණද ලබාදී ආශීර්වාදද කළේය. කාලය ගතවීමත් සමගම උන්වහන්සේ මා හට සහ මගේ සෙසු සේවකයින්ටද අපටම කියා වාහන භාවිතා කරමින් එම ගුවන් තොටුපලට කිප වතාවක් ගමන් කිරීමට හැකියාව ලබා දුන්නේය. අජිට සිටින්නේ කොතරම් අපූරු දෙවි කෙනෙක්ද? එම දෙවියන්වහන්සේ තවමත් ජීවමානයි. උන්වහන්සේ ඊයෙක් අදක් සදාකාලයටම එකාකාරයි.

මාගේ ප්‍රිය පාඨකයෙනි, ඔබගේ හිස මත ආලේප කර ඇති දේ අත් අය හඳුනා නොගන්නා විට ඔබ අපහසුතාවයට පත්වෙනවාද? ඔබගේ වර්තමානයෙහි පවතින පහත් තත්ත්වය දැක ඔබ අධෛර්යයට පත්වී තිබේද? ඔබගේම සම්පතමයන් ඔබව අවතක්සේරු කර තිබේද?

දෙවියන්වහන්සේ මෙසේ පවසන සේක;

"නුඹලාගේ සිත් නොකැලඹේවා .... උන්වහන්සේ නුඹලා සමඟ නැවතී සිටින සේක. නුඹලා තුලෙහි සිටින සේක." (යොහාන් 14:1,18)

දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ ජීවිතය ගතකරන්න.

දෙවියන්වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක්වා!

....Contd. from page 7

අද ඔබ මුහුණ දෙනු ලබන ඕනෑම සටනක්, ඔබ වටා තිබෙන ඕනෑම කියක්, ඔබ ඉදිරියේ තිබෙන ඕනෑම අවිනිශ්චිත භාවයක් ඉදිරියේ - මෙය මතක තබාගන්න:

අපට රක්ෂෙරාතයක් තිබේ!

★ එය තාවකාලික රැකවරණයක් නොවේ.

★ ධනය මත ගොඩනැගුණු රැකවරණයක් නොවේ.

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

★ කීර්තිය මත ගොඩනගාගත් රැකවරණයක් නොවේ.

★ බලය මත ගොඩනගා ගත් රැකවරණයක් නොවේ.

★ දක්ෂතා මත ගොඩනගා ගත් රැකවරණයක් නොවේ.

★ මිනිස් ශක්තිය මත ගොඩනගා ගත් රැකවරණයක් නොවේ.

නිසැකවම බොරුව මත ගොඩනගා ඇති රැකවරණයක් නොවේ.

අප ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සිටින සේක!

★ උන්වහන්සේ අපගේ සරණයි.

★ උන්වහන්සේ අපගේ බලකොටුවයි.

★ උන්වහන්සේ අපගේ ශක්තිමත් කුළුණයි.

★ උන්වහන්සේ අපගේ මුල් ගලයි.

★ උන්වහන්සේ අපගේ ස්ථිර අත්තිවාරමයි.

අපගේ මහා උත්තම පූජකයා සදහටම ජීවත් වන නිසා අපගේ රැකවරණය සදහටම පවතියි.

ආදරණීය සහෝදරයා සහෝදරිය, අප උන්වහන්සේ වෙතට දුවමු. ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔබගේ රැකවරණය ලෙස පිළිගන්න. උන්වහන්සේව සම්පූර්ණයෙන්ම විශ්වාස කරන්න. තුළ සැඟවී සිටින්න උන්වහන්සේ තුළ රැඳී සිටින්න.

මතක තබාගන්න:

උන්වහන්සේ අපගේ රැකවරණයයි!

****

NOTICE

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

Echo of His Call is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

ECHO OF HIS CALL

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846

Date of Publication: First week of every month

Date of Posting : 1st & 2nd of every month

Posted at "Egmore RMS Patrika Channel"

on 2nd NOVEMBER 2026.

If un-delivered please return to:

ECHO OF HIS CALL (SINHALA)

P.O. Box No. 2957,

Chepauk, Chennai - 600 005, INDIA.

Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

JESUS LOVES YOU!

To

GOD BLESS YOU!

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**